සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 12 ශ්‍රේණිය, දෙවන වාර පරීක්ෂණය, 2020 මාර්තු

**General Certificate of Education (Adv. Level), Grade 12, Second Team Test, March 2020**

**සංයුක්ත ගණිතය**

**Combined Mathematics**

10 S

පැය 03

**03 hours**

අමතර කියවීම් කාලය මිනිත්තු 10

විභාග අංකය:.....................................................................

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත වේ.
  **A කොටස** (ප්‍රශ්න 1 - 10) සහ **B කොටස** (ප්‍රශ්න 11 - 17)
- **A කොටස:**
  **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඒක එක් ප්‍රශ්නය සඳහා ඔබේ පිළිතුරු සපයා ඇති ඉඩෙහි ලියන්න. වැඩිපුර ඉඩ අවශ්‍ය වේ නම්, ඔබට අමතර ලියන කඩදාසි භාවිතා කළ හැකි ය.
- **B කොටස:**
  **ප්‍රශ්න පහකට පමණක්** පිළිතුරු සපයන්න. ඔබේ පිළිතුරු සපයා ඇති කඩදාසිවල ලියන්න.
- නියමිත කාලය අවසන් වූ පසු **A කොටසෙහි** පිළිතුරු පත්‍රය, **B කොටසෙහි** පිළිතුරු පත්‍රයට උඩින් සිටින පරිදි කොටස් දෙක අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයෙහි **B කොටස පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට අවසර ඇත.

---

- මෙම ප්‍රශ්න පත්‍රයේ g මගින් ගුරුත්වජ ත්වරණය දැක්වෙයි. ($g = 10ms^{-2}$)

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| (10) සංයුක්ත ගණිතය I | | |
|---|---|---|
| කොටස | ප්‍රශ්න අංකය | ලකුණු |
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| | 5 | |
| | 7 | |
| | 8 | |
| | 9 | |
| | 10 | |
| B | 11 | |
| | 12 | |
| | 13 | |
| | 14 | |
| | 15 | |
| | 16 | |
| | 17 | |
| | එකතුව | |
| | ප්‍රතිශතය | |

| | |
|---|---|
| I පත්‍රය | |
| II පත්‍රය | |
| එකතුව | |
| අවසාන ලකුණු | |

| අවසාන ලකුණු | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| සංකේත අංක | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| පරීක්ෂා කළේ | 1. |
| | 2. |
| අධීක්ෂණය කළේ | |

## A කොටස

(1) $f : x \rightarrow \sqrt{100 - x^2}$ ශ්‍රිතයේ වසම හා පරාසය සොයන්න. $f$ ශ්‍රිතය ඒකට එක ශ්‍රිතයක් නොවන බව පෙන්වා $f$ එකට එක ශ්‍රිතයක් වීමට $f$ හි වසම සඳහා කළයුතු සීමා කිරීම දක්වන්න.

(2) $\dfrac{1}{log_4 2020} + \dfrac{1}{log_5 2020} + \dfrac{1}{log_{101} 2020}$ හි අගය සොයන්න.

(3) ABC ත්‍රිකෝණයේ A ලක්ෂ්‍යය $x$ අක්ෂයේ ධන දිශාවේ ද, B ලක්ෂ්‍යය $y$ අක්ෂයේ ධන දිශාවේ ද පිහිටයි. $C \equiv (-2,3)$ ද, AB හා AC පාදවල දිග පිළිවෙලින් ඒකක $\sqrt{5}$ හා $3\sqrt{2}$ වේ. A හා B ලක්ෂ්‍යවල ඛණ්ඩාංක සොයන්න.

(4) $Tan(x+y) = \dfrac{Tan\,x + Tan\,y}{1 - Tan\,x.Tan\,y}$ ප්‍රකාශනය භාවිතයෙන් ,

$Tan(x+y+z) = \dfrac{Tan\,x + Tan\,y + Tan\,z - Tan\,x\,Tan\,y\,Tan\,z}{1 - Tan\,x\,Tan\,y - Tan\,y\,Tan\,z - Tan\,x\,Tan\,z}$ බව පෙන්වන්න. ඒනයින් $A + B + C = \pi$ හා $\theta$ ඕනෑම කෝණයක් විට $CoTACoT(B+\theta) + CoT(B+\theta)CoT(C-\theta) + CoT(C-\theta)CoTA = 1$ බව පෙන්වන්න.

(5) $\dfrac{2x^2-3x+2}{x^2(x-1)}$ හි භින්න භාග සොයන්න. ඒ නයින් $\dfrac{2x^2+x+1}{(x+1)^2 x}$ හි භින්න භාග අපෝහනය කරන්න.

(6) $Sin(\mathrm{A}+\mathrm{B}) = 2\,Sin(\mathrm{A}-\mathrm{B})$ නම් $Tan\,\mathrm{A} = 3\,Tan\,\mathrm{B}$ බව පෙන්වන්න. ඒ නයින් $(0,\pi)$ ත් අතර පිහිටන $Sin\left(\mathrm{A}+\pi/6\right) = 2\,Sin\left(\mathrm{A}-\pi/6\right)$ සමීකරණයේ A හි අගයන් සොයන්න.

(7) $\lim_{x \to 0} \left( \frac{\sqrt{4+\text{Sin}\,x}-2}{1-\text{Cos}\,x} \right) x = \frac{1}{2}$ බව පෙන්වන්න.

(8) $\boldsymbol{x} = \lambda \boldsymbol{i} + 2\boldsymbol{j}$ බව පෙන්වන්න. හා $\boldsymbol{y} = 2\boldsymbol{i} + \boldsymbol{j}$ වේ. $\boldsymbol{x}$ හා $\boldsymbol{y}$ එකිනෙක ලම්භක නම් $\lambda$ හි අගය සොයන්න.

$\lambda = 6$ විට, $\boldsymbol{x}$ හා $\boldsymbol{y}$ අතර කෝණය සොයන්න.

(9) ABCD සෘජුකෝණාස්‍රයේ AB = $2a$ හා AD = $a$ වේ. P, 2P විශාලත්ව සහිත බල $\overrightarrow{AB}, \overrightarrow{BC}$ පාද ඔස්සේ පිළිවෙලින් ක්‍රියාකරන අතර ඝූර්ණය 5aP වූ බල යුග්මයක් ADCB අතට ක්‍රියා කරයි. බල පද්ධතියේ සම්ප්‍රයුක්තයේ ක්‍රියා රේඛාව AB හා AD පාද පිළිවෙළින් H හා K හිදී හමුවේ නම් AH හා AK සොයන්න.

.............................................................................................................................................

(9) අංශුවක් AB සරල රේඛාවක් ඔස්සේ ඒකාකාර ත්වරණයෙන් ගමන් කරයි. A හි දී හා B හි දී එහි ප්‍රවේග පිළිවෙලින් $6ms^{-1}$ හා $16ms^{-1}$ වේ. A හා B අතර චලිතයට අංශුවට ගතවූ කාලය තත්පර 20 කි.

(i) A පසුකර 10 s කාලයකට පසු

(ii) AB හි මධ්‍ය ලක්ෂ්‍යයේදී

අංශුවේ ප්‍රවේග සොයන්න.

.............................................................................................................................................

## B කොටස

**ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(11) (a) $ax^2 + x + b = 0 \ (a \neq 0)$ සමීකරණයේ මූල $\alpha$ හා $\beta$ වේ. $\alpha+\beta$ හා $\alpha\beta$ හි අගයන් ලියා දක්වන්න. ඒ නයින් $(\alpha+\beta)^2$ හා $\alpha\beta(\alpha+\beta)$ හි අගයන් ලබා නොගනිමින් මූලයන් $\alpha(\alpha+\beta)$ හා $\beta(\alpha+\beta)$ ලෙස ඇති වර්ගජ සමීකරණය අපෝහනය කරන්න.

(b) $f(x) = x^3 + 8x^2 + 23x + 21$ හා $g(x) = x^2 + 7x + 16$ ලෙස ගනිමු.

ශේෂ ප්‍රමේය භාවිතයෙන් $f(x), (x+1)$ න් බෙදූ විට ශේෂයත්,

$g(x)$, $x$ වලින් බෙදූ විට ලැබෙන ශේෂයත් සොයන්න.

$f(x) = (x+1)\, g(x) + 5$ බව සත්‍යාපනය කරන්න.

$f(x)$, $x(x+1)$ න් බෙදූ විට ශේෂය සොයන්න.

---

(12) (a) $f(x) = x^2 + 2x + 2$ හා $g(x) = 6x^2 + 8x + 11$ යැයි දී තිබේ. $f(x) + \lambda\, g(x)$, $a(x+b)^2$ ආකාරයට වන පරිදි $\lambda$ හි අගයන් සොයන්න. මෙහි $a, b$ නිර්ණය කළ යුතු නියත වේ.

(b) $x^2 + ax + bc = 0$ හා $x^2 + bx + ac = 0$ යැයි දී තිබේ. මෙහි $a, b, c,$ අසමාන නිශ්ශුන්‍ය සංඛ්‍යා වේ.

මෙම සමීකරණවලට පොදු මූලයක් තිබේ නම් එම පොදු මූලය සොයන්න.

සමීකරණ දෙකේ ඉතිරි මූල සපුරාලන සමීකරණය $x^2 + cx + ab = 0$ බව පෙන්වන්න.

---

(13) (*a*) $\dfrac{x+3}{x+2} \leq \dfrac{x}{1+x}$ තෘප්ත කරන $x$ හි අගය කුලකය සොයන්න.

(b) එකම සටහනක $y = f(x) = |x-3| + 1$ හා $y = g(x) = 2|x-4|$ ශ්‍රිතවල ප්‍රස්තාර අඳින්න.

ඒ නයින් $|x-3| + 1 \geq 2|x-4|$ අසමානතාව තෘප්ත කරන $x$ හි සියළුම තාත්වික අගයන් සොයන්න.

ඒ නයින් $|x| + 1 \geq 2|x-1|$ අසමානතාවේ විසඳුම් අපෝහනය කරන්න.

(14) (*a*) $\dfrac{\text{Sin}\,3\theta}{1+2\,\text{Cos}\,2\theta}=\text{Sin}\,\theta$ බව පෙන්වන්න.

ඒ නයින් $\text{Sin}\dfrac{\pi}{12}=\dfrac{\sqrt{3}-1}{2\sqrt{2}}$ බව අපෝහනය කරන්න.

(b) $\text{Tan}\,3\theta+\text{Tan}\,2\theta=0$ සමීකරණයේ සාධාරණ විසඳුම් සොයන්න.

$\text{Tan}\,3\theta=\dfrac{3\,\text{Tan}\,\theta-\text{Tan}^3\,\theta}{1-3\,\text{Tan}^2\,\theta}$ ප්‍රකාශනයත්, ඉහත ප්‍රතිඵලත් භාවිතයෙන් $x^2 - 10x + 5 =$ ද සමීකරණයේ මූල $\text{Tan}^2\dfrac{\pi}{5},\ \text{Tan}^2\dfrac{2\pi}{5}$ බව පෙන්වන්න.

(c) $2Tan^{-1}x+CoT^{-1}x=\dfrac{2\pi}{3}$ සමීකරණය විසඳන්න.

(d) ABC ඕනෑම ත්‍රිකෝණයක BC ආධාරකය මත D ලක්ෂ්‍යය BD : DC = m : n වන පරිදි පිහිටයි.

$B\hat{A}D=\alpha,\ D\hat{A}C=\beta$ හා $C\hat{D}A=\theta$ නම් සුදුසු ත්‍රිකෝණ දෙකකට සයින් නීතිය යෙදීමෙන් $(m+n)\text{CoT}\theta=m\text{CoT}\alpha-n\text{CoT}\beta$ හා $(m+n)\text{CoT}\theta=n\text{CoTB}-m\text{CoTC}$ බව පෙන්වන්න.

---

(15) (a) O ලක්ෂ්‍යයක් අනුබද්ධව B හා C ලක්ෂ්‍යවල පිහිටුම් දෛශික පිළිවෙලින් ***b*** හා ***c*** වේ. BC පාදය L හිදී BL : LC; 2 : 1 අනුපාතයට බෙදෙන B හා C අතර පිහිටන L ලක්ෂ්‍යයේ පිහිටුම් දෛශිකයට ප්‍රකාශනයක් ලබාගන්න.
AL හි මධ්‍ය ලක්ෂ්‍යය O වන අතර O ලක්ෂ්‍යයට අනුබද්ධව A හි පිහිටුම් දෛශිකය ***a*** වේ. $3\mathbf{a}+\mathbf{b}+2\mathbf{c}=0$ බව පෙන්වන්න. M ලක්ෂ්‍යය CA මත C හා A අතර CM : MA = 3 : 2 වන පරිදි පිහිටයි. BOM සරල රේඛාවක් බව පෙන්වා BO : OM අනුපාතය සොයන්න. N ලක්ෂ්‍යය AB මත පිහිටන්නේ CON සරල රේඛාවක් වන පරිදි ය. AN : NB අනුපාතය සොයන්න.

(b) රූපයේ ACXW හා BCYZ සමචතුරස්‍ර වේ.
$\overrightarrow{CA}=\mathbf{a}$, $\overrightarrow{CB}=\mathbf{b}$, $\overrightarrow{CX}=\mathbf{x}$, $\overrightarrow{CY}=\mathbf{y}$ වේ.
$\mathbf{a}\cdot\mathbf{b}+\mathbf{x}\cdot\mathbf{y}=0$ බව පෙන්වන්න. ඒ නයින් AY, BX ට ලම්බක බව පෙන්වන්න.



(16) ($a$) ඒකතල බල පද්ධතියක්, නිව්ටන්වලින් මනිනු ලැබූ බල 5 කින් සමන්විත ය. එම බල හා බල ක්‍රියාකරන ලක්ෂ්‍ය පිළිවෙලින් පහත දක්වා ඇත.

| ලක්ෂ්‍ය | පිහිටුම් දෛශිකය | බලය |
|---|---|---|
| O | 0 | $\mathbf{i}$ |
| A | $3\mathbf{i}$ | $4\mathbf{j}$ |
| B | $3\mathbf{i}+4\mathbf{j}$ | $2\mathbf{i}$ |
| C | $4\mathbf{j}$ | $5\mathbf{j}$ |
| D | $a\,\mathbf{i}$ | $P\,\mathbf{i}+Q\,\mathbf{i}$ |

මෙහි $\mathbf{i}$ හා $\mathbf{j}$ පිළිවෙලින් සෘජුකෝණාස්‍ර කාටිසියානු අක්ෂ පද්ධතියේ $Ox$ හා $Oy$ අක්ෂ ඔස්සේ ඒකක දෛශික දක්වයි. ඒකක මීටර් වේ. මෙම බල සංරචක ආකාරයට, ක්‍රියාකරන ලක්ෂ්‍ය වල ඛණ්ඩාංක දක්වමින් රූප සටහනක නිරූපණය කරන්න. මෙම බල පද්ධතියේ O, A හා B ලක්ෂ්‍ය වටා වාමාවර්ත ඝූර්ණ පිළිවෙලින් $\lambda, \mu$ හා $\gamma$ වේ.

(i) $\lambda - \mu = 27$ නම්, එවිට $Q = 0$ බවත්,

(ii) $\gamma - \mu = 20$ නම්, එවිට $P = 0$ බවත් පෙන්වන්න.

පද්ධතිය සමතුලිත නම් P, Q හා $a$ හි අගයයන් සොයන්න.

(b) පැත්තක දිග $a$ වූ ABCD සමචතුරස්‍රයක $\overrightarrow{AB}, \overrightarrow{BC}, \overrightarrow{CD}, \overrightarrow{DA}$ ඔස්සේ P, 4P, 2P, 6P බල ක්‍රියා කරයි. බල පද්ධතියේ සම්ප්‍රයුක්ත බලයේ විශාලත්වය සොයන්න. AB, AD ඛණ්ඩාංක අක්ෂ ලෙස සළකමින් බල පද්ධතියේ සම්ප්‍රයුක්ත බලයෙහි ක්‍රියා රේඛාවේ සමීකරණය $2x - y + 6a = 0$ බව පෙන්වන්න.

(17) (a) මෝටර් රථ තරග මාර්ගයක දිනුම් කණුවට 1040m දුරක් තිබිය දී A මෝටර් රථය $32ms^{-1}$ ප්‍රවේගයෙන් හා $\frac{1}{2}ms^{-2}$ ඒකාකාර ත්වරණයෙන් ගමන් කරයි.

මෙම මොහොතේම A ට 456m ක් පිටුපස තිබෙන B මෝටර් රථය $48ms^{-1}$ ප්‍රවේගයෙන් හා $\frac{3}{4}ms^{-2}$ ක ඒකාකාර ත්වරණයෙන් ගමන් කරයි. චලිත සමීකරණ යෙදීමෙන් දිනුම් කණුවට 128m දුරක් තිබිය දී B විසින් A පසුකරන බව පෙන්වන්න. එවිට රථවල ප්‍රවේග සොයන්න.

(b) දුම්රිය පොළ දෙකක් අතර දුර $\frac{10675}{12}$m වේ. A දුම්රිය එක් දුම්රිය පොළකින් නිශ්චලතාවයෙන් ගමනාරම්භ කර $2.0ms^{-2}$ ඒකාකාර ත්වරණයෙන් ගමන් කරයි. දුම්රිය අනෙක් දුම්රිය පොළේ දී නිශ්චලතාවයට පත්වන්නේ $3.0ms^{-2}$ ඒකාකාර මන්දනයෙනි. චලිතයේ අතරමැදි කොටසේදී A දුම්රිය ඒකාකාර ප්‍රවේගයෙන් ගමන් කරයි. චලිතය සඳහා ප්‍රවේග කාල ප්‍රස්තාරය අඳින්න. චලිතයට ගත වූ කාලය 3 min ක් වේ නම් දුම්රිය ගමන් කරන ලද ඒකාකාර ප්‍රවේගය සොයන්න.